
# අතුරුදහන් වූ ප්‍රතිමාව



# අතුරුදහන් වූ ප්‍රතිමාව

නෙතුමි සෙහස්නා හේරත්

**කතෘ**

**කතෘගේ වෙනත් කෘති:**

තුන් ඉරි අප්පු

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

7-D

2025.02.08

ISBN: 978-624-208-230-1

# පිදුම

වදන් රසට ගලපාලා
නිවාඩුවට පොතක් ලියා
එය ඔබ හට පුද දෙන්නට
මම ආසාවෙන් හිටියා
ඒ සිහිනය සැබෑ වුණා
මගේ පැතුම් ඉටු වූවා
සොදුරු පොතක් මම ලිව්වා
විදුහල්පතිතුමියනි මගේ
පොත පුද දෙමි ඔබතුමියට
හදේ පිරුණු
ආදරයෙන්
ගෞරවයෙන්
හද බැතියෙන්.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “හෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# පටුන.

01. සොරකමක් .

02. පරීක්ෂණයට මුල පුරයි .

03. ඇමතුමක් .

04. අභිරහස් සිතියම .

05. බැංකුව ළඟ දී .

06. ආගන්තුකයෙක් .

07. ප්‍රතිමාව සොයා ගනී .

## *01. සොරකමක්*

එදා ඉරිදා දවසක් විය. විලියම් අවුරුදු 15ක පාසැල් දරුවෙකි. ඔහුගේ විනෝදාංශය තම මිතුරා වන විල් සමඟ ගොල්ෆ් ක්‍රීඩා පිටිවල ඉතුරු වුණු බෝල එකතු කර අලෙවි කිරීමයි.

එදින මොවුන් දෙදෙනා ගොල්ෆ් බෝල එකතු කර ඒවා විශාල මළුවල පුරවාගෙන තම නිවස බලා පියමං කරද්දී තම හිස වසා ගත් පුද්ගලයෙකු විලියම් අත තිබුණු ගොල්ෆ් බෑගය රැගෙන පැන ගත්තේය.

ඔහුව දුටු විගසම විල්ට ඒ කවුරුන් දැයි හඳුනා ගැනීමට නොහැකි විය. '' විලියම් ඒ අර අර ඉන්නේ ඉන්නේ ක....ක් '' එය කියා හමාර කිරීමට පෙර විල්ට ක්ලාන්තයක් හැදුණි.

# 02. පරීක්ෂණයට මුල පුරයි

" විල් මොකද වුණේ ? කතා කරන්න විල්." විලියම් ඔහුව රැගෙන අසල ගසක් මුල හිඳුවා සිය දුරකථනය ගෙන වාහනයකට කතා කළේය. නමුත් කිසිදු පිළිතුරක් නොවීය.

ඒ විගසම අමුතු දෙයක් විලියම්ට දැක ගන්නට විය. ඒ 'සිරින්ජරයක් ' විය. එය පිරික්සීමේදී විලියම් ඒ මගින් විල් හට විෂක් ඇතුළු වන්නට ඇතැයි සිතුවේය. එනමුත් එම විෂ මාරාන්තික එකක් නොවන බැවින් ටික වෙලාවකින් විල්ට සිහිය ආවේය.

" විලියම්,මම දැක්කා ඔයා පිටි පස්සේ මනුස්සයෙක් හිටියා. උඵ ඔයාට මොනවදෝ කරන්න හැදුවා. ඒකට බය වෙලා තමයි මට කලන්තේ දැම්මේ " යැයි විල් කීවේය.

" එතකොට ඔයාට විෂක් ඇතුළු වුණේ නැද්ද? " යැයි අතේ තිබුණු සිරින්ජරය පෙන්වමින් විලියම් ප්‍රශ්න කළේය.

" ඈ !! මොන විෂක්ද? මට මොකුත් විෂක් ඇතුළු වුණේ නෑ කියන එක  මට විශ්වාසයි." පුදුමයට පත් විල් කීවේය.

" හරි කමක් නැහැ. අපි දැන් යමු ඉක්මනට" දෙදෙනාම හිස් අතින් ම ගෙදර ගියේය.

************************************

" අපි නිකන් ඉදලා හරි යන්නේ නෑ විල්. මොකක් හරි කරන්න ඕනි අපේ ගොල්ෆ් මල්ල ගත්ත එකාට " විලියම් අධිෂ්ඨානශීලිව කීවේය.

## 03. ඇමතුමක්

ගෙදර ගිය විගසම විලියම්ට දුරකථනය නාද වන හඬක් ඇසිණි. දුරකථනය ළඟට ගොස් එම ඇමතුමට සවන් දුන්නේය.

" ගොල්ෆ් බෑග් එක දොර ළඟ " ඇමතුම අවසාන විය.

එය ඇසුණු විගසම දොර ඇර වට පිටාව බැලුවද බෑගය එහි නොවීය. නැවත පිටුපස හැරුණු විට ම ඔහුට කෑ ගැස්සිණි. ඒ විගසම ඔහුට තදින් පොලු පහරක් වැදිණි.

***********************************************************

" විලියම් නැගිටින්න, මොකද මේ?" විල් කෑ මොර දෙන්නට විය.

" ආ.....යි.. මගේ ඔලුව " විලියම් වේදනා සහගතව අවදි විය.

*04. අභිරහස් සිතියම*

විල්ගේ ආධාරයෙන් විලියම් පුටුවක වාඩි කර කතා බහක නිරත විය.

" දැන් ඉතින් මොකද වුණේ? " ප්‍රශ්නය විලියම් ගෙනි. සිදු වූ සියල්ල විල් විස්තර කළේය.

" හරි පුදුමයි. මට හිතා ගන්නවත් බෑ මේ මොනාද වෙන්නේ කියලා. මේ බලන්නකෝ මම ඔයාගේ ගෙදර එනකොට

පාරේ මේක වැටිලා තිබුණා." කුඩා කොලයක් වැනි යමක් විල් පෙන්වීය.

වේදනා ඇතිව විලියම් කොළ කැබැල්ල දිග හැර එය පිරික්සන්නට විය. මද වෙලාවකට පසු තම හඬ අවදි කළ

විලියම් එය කුමක්දැයි ප්‍රකාශ කළේය.

මේක මට හොදට හුරු පුරුදු සිතියමක් කියලයි මට හිතෙන්නේ විල්. ඒක මට 100% විශ්වාසයි. " විලියම් කීවේය.

එය අසා සිටි විල් හට ද විලියම්ගේ ප්‍රකාශය සත්‍යයක් බව පෙනුණේය. "ඔව් විලියම් මටත් ඒක නිකමට වගේ හිතුණා."

"මේක මට පහර දුන්න කෙනා අතින් වැටෙන්න ඇතියි කියලා විශ්වාස කරනවා." විලියම් කියා පෑවේය.

" හොදට මතක් කරන්න විලියම් මේක අපිට හුරු පුරුදු තැනක්. මට යාන්තමට වගේ මතකයි." විල් කල්පනාකාරීව කියා පෑවේය.

" මේ තියෙන්නේ අපේ නගරේ බැංකුව වෙන්න බැරිද ? මොකද මේ කාමරවල තියෙන දොරවල් දිහා බැලුවම මේක බැංකුවක් වගේ. ඔව් මේක අපේ නගරේ බැංකුව තමා." විලියම් ප්‍රීතියෙන් කියා සිටියේය.

"ඔව් ඔව් මේ බැංකුවම තමයි. මටත් විශ්වාසයි. එහෙනම් මේකේ අයිතිකාරයා බැංකුව කඩන්නයි යන්නේ " විල් සිතියම දෙස බලමින් කීවේය.

## 05. බැංකුව ළඟ දී

උදෑසන 9ට පමණ නගර මධ්‍යයේ පිහිටි බැංකුවේ දොර අභියස යහළුවන් දෙදෙනා රැකවල් ලා ගත්හ.

එනමුත් සාමාන්‍ය ආකාරයටම බැංකුවේ වැඩ කටයුතු සිදුවන බැව් දැන ගත මේ දෙපළ නිවස බලා පිටත් විය.

යන අතරමගදී පාරේ කිසියම් නොසන්සුන් බවක් විල්ට හා විලියම්ට පෙනිණි. මදක් ලං වී බැලූ ඔවුන්ට වෙඩි කෑ ආරක්ෂක භටයෙකු දක්නට ලැබිණි.

ඉන් කිපුණු විල් වටපිට පිරික්සීමට වුයේය. " මොකද මේ වෙලා තියෙන්නේ. මේ කෞතුකාගාරයනේ " විල් කීවේය. "මේ මිනිහා අපිව රවට්ටලා වගේ " විලියම්ට කියවුණේය.

මේකේ තියෙන දෙයක් මුන් හොරකම් කළා වෙන්න බැරිද? " විල් කීවේය.

" ඔව් ඒක තමයි වෙලා තියෙන්නේ දැන්ම මේක හොයන්න ඕනේ. " විල් කල්පනාකාරීව කීවේය.

කෞතුකාගාරය ඇතුලට පිවිසුණු මොවුන් දෙදෙනාට අමුත්තක් දැක ගැනීමට හැකි විය.

කෞතුකාගාරය තුළ වූ දේව ප්‍රතිමාව එතැන නොතිබීමයි පුදුමයට කාරණය. එම ප්‍රතිමාව මෙහි අධි ආරක්ෂිත කලාපයකයි තිබුණේ. ඒක කොහොමද පිටතට ගත්තේ?

විලියම් හා විල් දෙදෙනා අවට පරීක්ෂා කළ අතර නැවතත් ඉරී ගිය කොළ කැබැල්ලක් දැක විල් එය අතට ගත්තේය.විලියම් එය දැක එම කොළය දැකලා පුරුදු බවක් මුහුණෙන් පෙන්නුවේය.

## *06. ආගන්තුකයෙක්*

'' මේක මගේ ගෙදර තිබුණු සිතියම නේද? '' විලියම් ඇසුවේය.

'' නෑ ඒ මේක නෙවෙයි. මේ එකේ ඉතිරි කොටස. '' විල් කඩදාසිය පිරික්සමින් කීවේය.

විලියම් තම සාක්කුවෙන් පෙර හමු වූ සිතියම් කොටස එළියට ගෙන කොළ කැබලි දෙකම එකට තැබුවේය.

අහෝ පුදුමයකි !! සිතියම් දෙක එකට තැබූ විට බැංකුවත් කෞතුකාගාරයත් අතර යම් උමං මාර්ගයක් පැහැදිලිව

පෙනුණි.

' විලියම් ' යැයි කියා නොදන්නා පුද්ගලයෙක් විලියම් ඇමතුවේය. දෙදෙනා ළඟට ආ මොහු මෙසේ කීවේය.

" මම තමයි ඔයාලා එක්ක මේ අභිරහස විසඳන්න ආවේ." ආගන්තුකයා කීවේය.

" ආ එහෙමද? ඔයාගේ විස්තර ටිකක් කියන්නකෝ " විල් කීවේය.

" මම වැඩ කරන්නේ අභිරහස් දෙපාර්තමේන්තුවේ. නම මාර්ටින්. " ආගන්තුක පුද්ගලයා කීවේය.

" මට පොඩ්ඩක් ඔයාගේ හැඳුනුම්පත බලන්න පුලුවන්ද? විල් ඇසුවේය.

ආ....ආ..... ඒක මේ.. තිබ්බා .. මට අද ඒක අමතක වෙලානේ. " මාර්ටින් කීවේය.

" හරි කමක් නෑ. මේ ප්‍රතිමාව ගැන ඔය මොනවද දන්නේ? " ප්‍රශ්නය විලියම්ගෙනි.

" මේක ඉතා පැරණි මිල කළ නොහැකි ප්‍රතිමාවක්. මේ ප්‍රතිමාව සොරකම් කිරීමට බොහෝ දෙනා උත්සාහ කරලා

තියෙනවා. ඒත් එය අසාර්ථක වී ඔවුන්ව පොලීසිය අල්ලාගෙන තියෙනවා. "

විල් දුරකථනය ගෙන ඇමතුමක් ලබා ගත්තේය. විනාඩි 5කට පමණ පසු ආපසු පැමිණි විල් තම සගයාට රහසින් යමක් කීවේය.

ඉන්පසුව විලියම් හා විල් මෙසේ කීය.

" අපි දෙන්නාගේ රහස් තොටුපලක් තියෙනවා. අපි එතනට ගිහිල්ලා මේක ගැන කතා කරමු. " පසුව මාර්ටින් හිස

වන එය අනුමත කළේය.

තිදෙනාම ටැක්සි රියක් ගෙන තම තොටුපල වෙත ගියහ. මද වෙලාවකට පසු රථය පොලීසිය අසල නතර විය.

## *07. ප්‍රතිමාව සොයා ගනී*

පොලීසිය දුටු මාර්ටින් යම් කලබලකාරී ස්වරූපයට පැමිණෙන බැව් දුටු විල් ඔහුගෙන් " ඇයි මේක දැක්කම ඔහොම

බය වෙන්නේ යැයි ඇසුවේය. "

" නෑ නෑ එහෙම මොකුත් නෑ " කියමින් මාර්ටින් තම අතේ තිබූ බෑගය පිටුපසට ගත් බව විල් දුටුවේය.

රථයේ දොර ඇරෙත්ම පොලිස් නිලධාරීන් දෙදෙනෙකු සිට මර්ටින්ව අත්අඩංගුවට ගන්න ලදී.

පොලීසිය ඇතුලට ගොස් විල් හා විලියම් දෙදෙනා මාර්ටින්ගේ ක්‍රියා පිළිබඳ පොලීසියට කීමට මුල පිරුවේය.

" මෙයා තමන්ගේ හැඳුනුම්පත අමතක වෙලා කියනකොට ම තමයි මට සැක හිතුණේ.සාමාන්‍යයෙන් අභිරහස්

පරීක්ෂකයෙකුට තම හැඳුනුම්පත අමතක වෙනවා කියන්නේ පුදුම වෙන්න ඕනේ. " විල් කීවේය.

" තව එකක් තමයි මෙයා කෞතුකාගාරයඇතුලේ ඉද්දි හරි අමුතු බයකින් හිටියේ."

විලියම් තවත් කරුණු එකතු කළේය.

පසුව විල් මර්ටින්ගේ බෑගය ගත් විට මල්ලක් තුල බහාලූ ඝන ද්‍රව්‍යයක් , පසුම්බියක් හමු විය.

මල්ල ලිහා බැලූ විට නැති වූ දේව ප්‍රතිමාව එහි විය. පසුම්බිය පරීක්ෂා කල විට එහි ඡායාරූපයක සිටි පුද්ගලයා මාර්ටින් නොවීය.

" පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉන්න. " විලියම් කීය. අනතුරුව මාර්ටින්ගේ රැවුල අත ගා එය වේගයෙන් ඇද්දේය.

එය ගැලවී ආවේය. එවිට අර ඡායාරූපයේ සිටි පුද්ගලයාගේ පෙනුම ආවේය පොලීසිය එවිට මොහුව හදුනා ගෙන මෙසේ කීහ.

"ආ... මෙයාව අපි ගොඩක් කල් ඉදන් හොයන කෙනෙක් නේ. " මොකුත් කර කියා ගත නොහැකිව සිටි මාර්ටින් විල් හා විලියම් දෙස රව්වේය.

'' මෙය පොලීසියට අහුවෙයි කියලා බයට තමයි අපි ගාවට ඇවිල්ලා අපේ පරීක්ෂණයට එකතු වෙන්න හැදුවේ. ඒවා කොහෙද අපිත් එක්ක. '' විල් කීවේය. ''

'' මුල ඉදලම මෙයා දැනගෙන හිටියා අපි රහස් පරීක්ෂකයෝ කියලා. ඒක නිසා තමයි අපේ ගොල්ෆ් මල්ල අරගෙන විල්ට ගැහුවේ. ඊට පස්සේ මෙයා මටත් පහර දුන්නා. ඒ යන ගමන් තමයි අර සිතියම් කැබැල්ල ඉරිලා වැටුණේ. '' විලියම් තවත් මෙය පැහැදිලි කළේය.

'' ඇයි ඉතින් ඒක ගත්තේ නැත්තේ මෙයා? '' පොලිස් නිලධාරියෙක් ඇසුවේය.

'' මොකද ඒ වෙලාවේ ම විල් අපේ ගෙදර ආවා. එයා එනවා දැකලා මෙයාට එක ගන්න අමතක වුණා. විලියම් පිළිතුරු බැන්දේය .

'' හරි කොහොමහරි අපි පිළිමය හොයා ගත්තනේ. දැන් මේකව හිරේ දාමු නේද '' විල් සිනාසී කීවේය.

දේව ප්‍රතිමාවත් සමඟ කෞතුකාගාරයට ගිය මේ දෙදෙනා එය එහි තැන්පත් කොට තම නිවෙස් බලා පිටත් වීමට වග බලා ගත්ත

*නිමි.*

# <u>පසුවදන</u>



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,

සෙනෙවිරත්න මහලේකම්